චක්‍රලේඛ අංක: 02/99

මගේ අංකය: බප/සසේකො/ලේ/තීර
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
1999.01.07

බස්නාහිර පළාතේ සියලුම සමුපකාර සමිති
සභාපතිවරුන් වෙත,

සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහය

සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5:7:1 වගන්තිය සහ 1997.09.01 දින ම නිකුත් කරන ලද අංක 6/97 චක්‍රලේඛයේ 04 වන ඡේදය යටතේ සමුපකාර සේවක කාර්ය විධිවිධාන සංග්‍රහයේ 5:7:1 වගන්තිය වෙනුවට ආදේශ කර ගත යුතු බවට සඳහන් කර ඇති වගන්තිය ද ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිත් ඇතුලත් කර ගත යුතු යයි බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇත.

5:7:1 (අ) යම් සේවකයෙක් සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්ෂණයකදී පරීක්ෂණ නිලධාරියා ගේ නිගමන නිගමනයන් පිළි ගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට නැතහොත් ප්‍රතිශෝධනය කිරීමට සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබේ. එහෙත් එම නිගමනවලට එකඟ නොවන අවස්ථාවකදී එසේ එකඟ නොවීමට ඇති හේතු පිළිබඳව එත්තෑ ගත හැකි ආකාරයෙන් සකස් කරන ලද සම්පූර්ණ විස්තර වාර්තාවක් පරීක්ෂණයේදී දදිරිපත් ව තිබූ සාක්ෂි අනුසාරයෙන් සකස් කර එහි පිටපතක් විනය පරීක්ෂණ වාර්තාවට අමුණා තමා තමා ගේ තීරණය ගත යුතු ය.

5:7:1 (ආ) යම් කිසි කරුණක් සම්බන්ධයෙන් වැඩි දුරටත් පැහැදිලි කරවා ගැනීමට සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය වුවහොත් එහි ලා වාර්තා කිරීම සඳහා හෝ වැඩි දුරටත් පරීක්ෂා කිරීම සඳහා හෝ යන මෙයින් අවශ්‍ය කාර්යයක් කිරීම සඳහා එම කාරණය පරීක්ෂණ නිලධාරියා වෙත ආපසු යොමු කිරීමට පුළුවන

5:7:1 (ඇ) විනය පරීක්ෂණ නිලධාරියා ගේ නිගමනවලට සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ නොවන අවස්ථාවලදී වෙනත් විනය පරීක්ෂණ නිලධාරියෙක් ලවා දෙවන විනය පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමට සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලයක් නොමැත. වැනි දෙවන විනය පරීක්ෂණයක් කළ හැකි වන්නේ අභියාචනයක් සලකා බැලීමෙන් පසු කොමිෂන් සභාවේ නියෝගයක් මත පමණි.

සමුපකාර සේවක කාර්ය විධාන සංග්‍රහයේ 5:12:9 වගන්තිය වශයෙන් පහත සඳහන් අලුත් ඡේදය ඇතුලත් කර ගත යුතු බව බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇත.

5:12:9 සේවකයකු ගේ වැඩ තහනම් කළ දින සිට මාස 12 ක් ඉකුත් වීමට පෙර ඔහුට විරුද්ධව චෝදනා පත්‍ර නිකුත් කර විනය පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ගැනීමට කිසියම් සමුපකාර සමිතියක් අසමත් වුවහොත් වැඩ තහනම් කළ දින සිට මාස 12 ක් ගත වූ පසු චුදිත නිලධාරියා නැවත සේවයෙහි පිහිටුවා විනය පරීක්ෂණ කටයුතු ඉදිරිට කර ගෙන යා හැකි ය. එවැනි අවස්ථාවලදී 5:12:7 වගන්තියේ සඳහන් දේ සිදු කර තිබුනත් චුදිත සේවකයා වැඩ තහනම් කරනු ලැබූ අවස්ථාවේදී ලත් සිටි වැටුප ලබා ගැනීමට හිමිකම් තිබේ. එහෙත් විනය

....02

පරීක්ෂණය සම්පූර්ණයෙන් අවසන් වනතුරු වැටුප් වර්ධක ලබා ගැනීමට හිමිකමක් නොමැත

5:12:7 වගන්තියේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වැඩ තහනම් කරනු ලැබූ චූදිතයන් සම්බන්ධයෙන් මෙම වගන්තිය යටතේ තීරණයක් ගැනීමට පෙර චූදිත සේවකයාගෙන් ඉල්ලීමක් ලැබුණු වහාම අධ්‍යක්ෂ මණ්ඩලය සමුපකාර සේවක කොමිෂන් සභාවට සම්පූ කරුණු වාර්තා කර පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. එහිදී සමුප සේවක කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේ ය.

මෙයට - විශ්වාසී

කේ. එස්. විමලවීර
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත්:-
1. ප්‍රධාන ලේකම් (බ.ප.)
2. ලේකම්, සෞඛ්‍ය, සමුපකාර හා වනිතා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)
3. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
4. සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් - කළුතර/ ගම්පහ/ කොළඹ
5. ලේකම්, සමුපකාර සේවක කොමිෂම
6. සියලුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරුන්
7. සියලුම වෘත්තීය සමිති සංගම් (බ.ප.)